ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date : 2016-07 · 21 |

පැමිණිලිකරු : ටී.එම්. ලංකාගේ මයා,
නො 28, කාන්ති පාර,
ගම්පහ.

වගඋත්තරකරුවන් : 01. අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත, කොළඹ 10.

02. අධ්‍යක්ෂක ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන අමාත්‍යාංශය,
අංක 98, ඩී.බී.ජයා මාවත,
ජනවතු පියස, කොළඹ 10.

<u>පැමිණිලි අංකය : **HRC/4138/14**</u>

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සදහන් කර ඇත්තේ, කාර්මික අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වසර 8 1/2ක කාලයක් සේවය කිරීමෙන් පසු තම විශ්‍රාම වැටුප් සහිත තනතුර අහෝසි කර විශ්‍රාම වැටුප් රහිත ආයතනයක් වන උසස් තාක්ෂණ ආයතනයේ සේවය සඳහා මුදාහරින ලද බවයි. පසුව වසර 5ක කාලයක් විශ්‍රාම වැටුප් සහිතව සේවයට එක් කර විශ්‍රාම වැටුප් සකස් කරන බවට ලිඛිතව දැනුම් දී තිබූ නමුත් වසර 10ක විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයක් නොමැතිව වසර 5ක සේවා කාලයක් එක් කළ නොහැකි බවට කරුණු දැනගත් පසු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් මේ පිළිබඳ විමසා බලන ලද බවත්, වසර 08ක දෙපාර්තමේන්තුගත සේවා කාලයක් සහිත අයෙකුගේ තනතුර අහෝසි වීම මත විශ්‍රාම ගන්වන ලද සේවකයින්ට විශ්‍රාම වැටුප් හිමිකම ඇති බව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන තුළ වූ 2:7 වගන්තිය යටතේ ඇති බව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක විසින්



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office : 165, කින්සි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
දුරකථන / தொலைபேசி / Telephone : 94 - 11 - 2694925, 2685980, 2685981
සභාපති / தவிசாளர் / Chairman : 011-2696470
ලේකම් / செயலாளர் / Secretary : 011-2689558
ෆැක්ස් / தொலைநகல் / Fax : 011-2696470
ක්ෂණික / துரித அழைப்பு / Hotline : 011-2689558, 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail : sechrc@sltnet.lk
වෙබ් / இணையம் / Web : www.hrcsl.lk

පෙන්වා දී තිබූ බවත් සඳහන් කර ඇත. නමුත් තවදුරටත් විශ්‍රාම වැටුප ලැබී නොමැති බව ද එය ලබා දෙන ලෙස ද මෙම පැමිණිල්ල මගින් ඉල්ලා සිට ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :**

1. ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයේ කරුණු දැක්වීම :

පැමිණිලිකරු ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයේ සේවය සඳහා 1997.12.10 දින කථිකාචාර්යවරයෙකු ලෙස පත්කර ඇති අතර, ඊට පෙර කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කර ඇති බවත්, ඉහත කී කථිකාචාර්ය පත්වීම ලබාදී ඇත්තේ 1997.01.29 දින වන අතර ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය කැබිනට් මණ්ඩල නිවේදනයක් අනුව පිහිටුවා ඇත්තේ ද එම කාලවකවානුවේදීම වන බවද සඳහන් කර ඇත. 2004.06.10 දින පැමිණිලිකරු සහ තවත් 09 දෙනෙකු ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අන්තර්ග්‍රහණය කර තිබීම මත කරුණාසහගත දීමනාවක් ලබාදෙන ලෙස අන්තර්ග්‍රහනය කළ අය ඉල්ලා ඇති බවත්, 2003.07.31 දින 69 වන පාලක සභා රැස්වීමේදී ලබාදී ඇති අනුමැතිය මත ගෙවීමට කටයුතු කර ඇත. 2011.04.23 දින පැමිණිලිකරු විසින් ඉල්ලා අස්වීමේ ලිපියක් භාරදී ඇති බවත් සඳහන් කර ඇත. නමුත් මෙම අවස්ථාවේ ඔහුට විරුද්ධව චෝදනාපත්‍රයක් නිකුත් කර තිබීම මත ඉල්ලා අස්වීම ආයතනය විසින් භාරගෙන නොමැති බවද 2012.01.24 දින දරණ ලිපිය මගින් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්වා ඇත්තේ විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 12:1 පරිච්ඡේදය අනුව 2011.09.27 දින සිට බලපැවැත්වෙන පරිදි බවද සඳහන් කර ඇත. 2013.02.26 දින ඔහු විශ්‍රාම ගන්වනු ලබන බව ඔහු අන්තර්ග්‍රහණය කිරීමට පෙර සේවය කළ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ජනරාල් වෙත දන්වා තිබී ඇති බවද දක්වා ඇත.

ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයට 1997.03.01 දින අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් හිමිකම් සඳහා පූර්ව සේවා කාලයට වසර 05ක් එකතු කිරීම සිදු කරන බව 2000.05.19 දිනැතිව පැවැත්වූ විගණක හා කළමණාකරණ කමිටුව විසින් අර්ථ නිරූපණය කර ඇති බවත් ඒ පිළිබඳව එසේ අන්තර්ග්‍රහණය කරන ලද කාර්ය මණ්ඩලයේ නිලධාරීන් දැනුවත් කරන ලෙසත් 2000.07.21 දින අධ්‍යක්‍ෂ ජනරාල් විසින් දන්වා තිබී ඇත. තවදුරටත් දන්වා ඇත්තේ ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය යනු විශ්‍රාම වැටුප් නොලබන ආයතනයක් බවයි. පැමිණිලිකරු ඒ පිළිබඳ දැන සේවයට පැමිණ ඇති බව ද විශ්‍රාම වැටුප් නොගැනීම සම්බන්ධව උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයට වගකීමක් නොමැති බව ඔහුට දන්වා පෙර සේවය කරන ලද කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව වෙත පැමිණිලිකරු විශ්‍රාම ගිය බව නිසි පරිදි දන්වා ඇති බවද පෙන්වා දී ඇත.

නමුත් පැමිණිලිකරු විසින් දක්වා ඇති පරිදි කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙන් උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයට නිදහස් කරන ලද නිලධාරීන් සඳහා විශේෂිත වූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ලබාගෙන ඇති බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් පැමිණිලිකරුට දන්වා ඇති බව කියා සිටියද ඒ සඳහා උසස් තාක්‍ෂණ අධ්‍යාපනයේ මැදිහත්වීමක් හෝ අදාලත්වයක් නොමැති බවද පෙන්වා දී ඇත.

**2. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ කරුණු දැක්වීම :-**

1997 වසරේ දී කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙන් තෝරාගත් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් අලුතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයට අනුයුක්ත කරන ලද බවත්, එහිදී රාජ්‍ය සේවයේ වසර 08ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2:7 වගන්තිය යටතේ එනම්, තනතුර අහෝසි වීම මත විශ්‍රාම ගන්වා විශ්‍රාම වැටුප ද ගෙවීමට පියවර ගෙන ඇති බවත් දක්වා ඇත.

රාජ්‍ය සේවයේ වසර 10ක සේවා කාලයක් සපුරා නොමැති නිලධාරියෙකු හට විශ්‍රාම වැටුප් සහිත තත්ත්වයක් ලබාදීමට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ නීතිරීති නොමැති බවද, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ වසර 10කට වඩා අඩු සේවා කාලයක් සහිතව ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය වෙත අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන් හට විශ්‍රාම වැටුප් සහිත තත්ත්වයක් ලබාදීමේ හැකියාවක් නොමැති බවද සඳහන් කර ඇත. එබැවින් එම අයට විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක් ගෙවීමේ හැකියාව පරීක්‍ෂා කර බැලීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇති බවත්, 2012.03.01 දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් අනුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ වසර 10කට වඩා අඩු සේවා කාලයක් ඇතිව ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ට විශ්‍රාම වැටුප් සහිත තත්ත්වය ලබාදීමේ හැකියාවක් නොමැති බව තීරණය කර ඔවුන්ට විශ්‍රාම පාරිතෝෂිකයක් පමණක් ගෙවීමට 2012.06.28 දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකා මගින් නිර්දේශයක් ලබාදී ඇති බවත්, ඒ අනුව පැමිණිලිකරුට විශ්‍රාම වැටුප් සඳහා හිමිකම නොමැති බවත් සඳහන් කර ඇත.

**පරීක්‍ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :**

2016.02.29 දින පරීක්‍ෂණය සඳහා පාර්ශවයන් පැමිණ සිට ඇති අතර පැමිණිලිකරු සඳහන් කර ඇත්තේ තමා කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ සිට උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයට අන්තර්ග්‍රහණය කිරීමෙන් පසු එහි කථිකාචාර්යවරයෙකු ලෙස වසර 8,

1/2ක් සේවය කර පසුව 2011.09.27 දින විශ්‍රාම ගත් නමුත් විශ්‍රාම වැටුප සකස් කර නොමැති බවයි. විශ්‍රාම වැටුප සකස් කිරීමේදී සලකා බැලියයුතු වන්නේ විශ්‍රාම ගන්නා අවස්ථාවේදී බලපාන නීතිරීති වන බව පැමිණිලිකරුගේ අදහස වේ. තමාට සමාන තත්ත්වයේ සේවයේ යෙදී විශ්‍රාම ගන්නා කිහිප දෙනෙකු අතරින් තමාට පමණක් වෙනස් ආකාරයකට සැලකීම තුලින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට පැමිණිල්ලෙන් දක්වා ඇත.

උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය විසින් දන්වා ඇත්තේ, පැමිණිලිකරුට එරෙහිව විනය පරීක්‍ෂණයක් පැවති බවද 2012.01.24 දින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙතද ගොනුව යවා තිබූ බවද චෝදනා පත්‍රයෙන් ඔහු නිදොස් කොට නිදහස් කළ බවද වේ.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටි නිලධාරීන් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරුගේ මෙම පැමිණිල්ලේ දී දැක්වියයුතු කරුණු ඇතුළත් වාර්තාව මීත් පෙර එවා ඇති බැවින් වෙනත් කීමට යමක් නොමැති බවත් එහි ඇති පරිදි අමාත්‍ය මණ්ඩල තීන්දුව පැමිණිලිකරුට විශ්‍රාම වැටුප් සකස් කිරීමට බලපෑමක් දක්වන බවත්ය.

නමුත් පැමිණිලිකරු ඉහත සියළු කරුණු වලට එරෙහිව සඳහන් කර ඇත්තේ, තමා විශ්‍රාම ගන්වන අවස්ථාව වනවිට එම අමාත්‍ය මණ්ඩල තීන්දුව නිකුත්ව නොතිබූ බැවින් පසු කාලීනව 2012.03.01 දිනැති නිකුත් කරන ලද කැබිනට් තීන්දුව 2011.09.27 දින විශ්‍රාම ගන්නා ලද තමාට අදාළ කර ගනිමින් ක්‍රියාත්මක කිරීම තුලින් තමාට හානියක් සිදුවන බවත් එසේ අදාළ කර ගන්නා ලද්දේ නම් තමා සමග විශ්‍රාම ගන්නා ලද වෙනත් නිලධාරීන් හා කථිකාචාර්යවරුන් හටද බලපෑමක් සිදු කරවීමට හේතු වියයුතු බවත්ය. වගඋත්තරකරුවන් ඒ සම්බන්ධව වෙනත් කරුණු ඉදිරිපත් කිරීමක් සිදුකර නොමැත.

**නිරීක්‍ෂණ හා නිගමනය :**

පැමිණිලිකරු කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ සේවය කරමින් සිටියදී උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය වෙත අනුයුක්ත කර ඇත්තේ ආයතනික අවශ්‍යතා මත මිස පැමිණිලිකරුගේ ඉල්ලීමකට අනුව නොවන බව නිරීක්ෂණය වේ. වසර 8.1/2ක් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ සේවය කරමින් සිටියදී විශ්‍රාම ගැනීමේ අවස්ථාව දක්වා සේවය කිරීමට ඔහුට හැකියාව තිබියදී පැමිණිලිකරු විසින් තම ඉතිරි සේවා කාලය ලබාදී ඇත්තේ උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයට වන බවද නිරීක්ෂණය වේ. පැමිණිලිකරු විශ්‍රාම ගෙන ඇත්තේ උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයේ සේවය කරමින් සිටියදී වන නමුත් විශ්‍රාම වැටුප ගණනය කිරීමේදී ඔහුගේ සේවා කාලය වසර 8. 1/2 ලෙස පෙර සේවා ස්ථානය වූ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේදී ලබා තිබීම විශ්‍රාම වැටුපක් ලබා

තිබීමට ප්‍රමාණවත් සේවා කාලයක් ලෙස නොසලකා හැරීමද උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සේවා කාලය නොසලකාහැර තිබීමද පැමිණිලිකරුට අසාධාරණයක් ඇතිකරවන කාරණාවක් වන්නේ ඔහු විසින් ඉල්ලන ලද ස්ථානමාරුවක් ලබාගනිමින් උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට ගිය අවස්ථාවක් ද නොවන බැවිනි. කාර්මික අධ්‍යාපන සේවය පැමිණිලිකරු බඳවාගෙන ඇත්තේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් බවට ලිඛිතව පත්වීමේ ලිපියේ සඳහන් කරමිනි.

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2:7 වගන්තිය යටතේ එනම්, තනතුර අහෝසි වීම මත විශ්‍රාම ගැන්වීමේදී විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන වලට අනුව දෙපාර්තමේන්තුගත අවුරුදු 8 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම අත්‍යාවශ්‍ය බව දක්වා ඇත. අවුරුදු 8 කට වඩා අඩු කාලයක් ඇති කාර්ය මණ්ඩලයට පමණක් විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමට නීතිමය ප්‍රතිපාදනයක් නොමැති බවද දක්වා තිබේ. පැමිණිලිකරුගේ දෙපාර්තමේන්තුගත සේවය අහෝසි කිරීමක් සිදුකරන විට වසර 8 කට වඩා වැඩි කාලයක් එනම්, වසර 8½ ක පමණ වූ සේවා කාලයක් තිබී ඇති බවද සනාථ වේ. නමුත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් කොමිෂන් සභාවට එවා ඇති වාර්තාවේ දක්වා ඇත්තේ රාජ්‍ය සේවයට වසර 10 ක සේවා කාලයක් සපුරා තිබීම විශ්‍රාම වැටුප් සහිත තත්වය ලබා ගැනීමට අවශ්‍ය බවය. නමුත් වසර 10 ක කාලයක සලකා බලන්නේ විශ්‍රාම වැටුප් ලබා ගැනීම සඳහා තිබිය යුතු සාමාන්‍යය ව්‍යවස්ථාපිත කාලය පිළිබඳව සලකායි. විශ්‍රාම වැටුප් සේවා ව්‍යවස්ථාවේ 2:7 වගන්තිය යටතේ දක්වන්නේ තනතුරක් අහෝසි වීමේ හේතුව මත සලකා බැලීමේදී තිබිය යුතු සේවා කාලය පිළිබඳවය. එනම්, වසර 8 ක් සේවය කර තිබීම අත්‍යාවශ්‍ය බවය. ඒ අනුව මෙම සේවා කාල දෙකක් වෙන් වෙන්ව දක්වා ඇත්තේ විශ්‍රාම ගැනීමේ තත්වයන් හෙවත් ස්වභාවයන් දෙකක් පිළිබඳව දැක්වීමටය. පැමිණිලිකරුට අදාළ වන්නේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2:7 වගන්තිය යටතේ තනතුර අහෝසි වීමේ පදනම මත හිමිවිය යුතු නීතිමය තත්වයන්ය. ඒ අනුව වසර 8 කට වඩා වැඩි සේවා කාලයක් දෙපාර්තමේන්තුගත සේවය අහෝසි කරන විට තිබී ඇති අතර ඒ පිළිබඳව නොසලකා හැර විශ්‍රාම වැටුප් සේවා ව්‍යවස්ථාවේ 2:7 වගන්තියේ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන උල්ලංඝනය කරමින් කටයුතු සිදුව ඇති බවද අනාවරණය වේ.

වසර 8½ක සේවා කාලයක් අවසන් කර, විශ්‍රාම වැටුප් ලබාගන්නා පිරිසක් සිටින බව පැමිණිලිකරු විසින් දන්වා ඇති අතර පැමිණිලිකරුට සමාන තත්ත්වයේ සේවයේ යෙදී කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුවේ සිට උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අනුයුක්ත කළ එම පිරිසකට පමණක් විශ්‍රාම වැටුප ගෙවීම පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් වන අතර 2012.03.01 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් මත උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් නැති ආයතනයක් තුළ කටයුතු කරන නිලධාරීන් බව දක්වා තිබීම ද එම අමාත්‍ය මණ්ඩල තීරණයට පෙර එනම් 2011.09.27 දින

විශ්‍රාම ගන්නා ලද පැමිණිලිකරුට අදාලව ක්‍රියාත්මක කරවීම සාධාරණ එකක් නොවන අතර අතීතයට බලපාන සේ නීති සකස් කිරීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යවස්ථාපිත අදහස් උල්ලංඝනය වන බැවින්ද ඉන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති සමානාත්මතාවයේ මූලික අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව පැමිණිලිකරුටද විශ්‍රාම වැටුප් හිමිකම් තත්ත්වය ලබාදීමට පියවර ගතයුතු බවට පළවන වගඋත්තරකරු වෙත මෙයින් නිර්දේශ කරමු.

2016.10.21 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. N. D. Udagama**
Chairperson
Human Rights Commission of Sri Lanka

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/..